Remove Watermark Now

# කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර
# දෙවන වාර පරීක්ෂණය - 2018
## ශ්‍රේණිය 10 විෂය - ව්‍යවසායකත්ව අධ්‍යයනය පත්‍රය 11
කාලය පැය 02

**සැලකිය යුතුයි .**

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

1) පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (1) සිට (10) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අනුරාධපුර නගරයේ පදිංචි නිර්මාල් විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන දෙවන වසර සිසුවෙකි.ඔහු දැනට වසර තුනකට පෙර රුවන්වැලි මහා සෑය සමීපයේ බෙලිමල් අලෙවිය සඳහා කුඩා ව්‍යාපාරයක් ආරම්භ කළේ රු.5000/- ක මුදලක් යොදවමිනි.විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන කටයුතු වල යෙදෙන අවස්ථා වලදී සිය වැඩිමල් සොහොයුරිය ව්‍යාපාරය පවත්වා ගෙන යන අතර අන් සෑම අවස්ථාවකදීම නිර්මාල් ව්‍යාපාර කටයුතු වල නිරත වෙයි.

දිවා රෑ මහන්සියෙන් ,අධිෂ්ඨානශීලීව ,දූරදක්නා නුවනින් කටයුතු කිරීම නිසා එම ව්‍යාපාරය අද එකවර හා දෙනෙකුට ආහාර ගත හැකි හෝටලයක් දක්වා දියුණු කරගෙන ඇත.මේ වන විට සේවකයින් තිදෙනෙකු ගේ සහය ද ලබා ගනියි.ඔවුන්ගේ දක්ෂතා වර්ධනය කර ගැනීම සඳහා සති හතරක පුහුණු පාඨමාලාවක් හැදෑරීමට ද යොමු කරන ලදී.නිරන්තරයෙන් නගරයේ හෝටල් හිමියන්ගෙන් එල්ල වන තර්ජන වලට නොබියව මුහුණ දෙමින් ව්‍යාපාරය නගරයේ හොඳම හෝටලයක් බවට පත් කිරීම ඔහුගේ එකම අරමුණ වේ.

i) නිර්මල්ගේ ව්‍යාපාරයේ අරමුණ කුමක්ද?
ii) ව්‍යාපාරය සපයන අවශ්‍යතාවය කුමක්ද?
iii) එම අවශ්‍යතාවය සපුරා ගැනීමට යොදා ගත හැකි වුවමනා හතරක් නම් කරන්න.
iv) ව්‍යාපාරයට ශක්තියක් වී ඇත්තේ කුමක්ද ?
v) මෙම ව්‍යාපාරය සාර්ථක වීමට හේතු වූ කරුණු දෙකක් දක්වන්න.
vi) “සේවකයන් ව්‍යාපාරයේ බාහිර පරිසර සාධකයකි” මෙම ප්‍රකාශය නිවැරදි කරන්න.
vii) සේවක දක්ෂතා වර්ධනය කිරීමට ගත් ක්‍රියාමාර්ගය කවරේද?
viii) ව්‍යාපාරයට තර්ජනයක් වී ඇත්තේ කව්රුන්ද ?
ix) “නිර්මාල් ව්‍යවසයකයෙකි”ඊට හේතුවක් දක්වන්න.
x) මෙම ව්‍යාපාරයේ ඉලක්ක වෙළඳ පොළ කවුරුන්ද ? (ල.2 x 10=20)

2) i) ප්‍රාග්ධනය හඳුන්වන්න.

ii) ව්‍යවසායකත්ව ගති ලක්ෂණ දෙකක් දක්වන්න.

iii) පහත ප්‍රකාශ සත හෝ අසත්‍ය දැයි ප්‍රකාශ කරන්න.

a) ව්‍යවසායකයා අවදානම් දරන්නෙකි.

b) විවේචනයට ඇති බිය නම්‍යශීලීත්වයට බාධාවකි.

c) ව්‍යාපාරයක අරමුණ ලාභ ලැබීම පමණි.

d) සිල්ලර වෙළෙන්දා ආයතනික ව්‍යවසායකයෙකි.

iv) සේවාවක දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ දෙකක් දක්වන්න.

v) "ඔබ පාසලේ කසළ ගොඩක් ඇත" එම ගැටළුව විසඳීමට යෝජනා දෙකක් ප්‍රකාශ කරන්න.

(ල.2 x 5 = 10)

3) i) බාහිර පරිසර සාධක දෙකක් නම් කරන්න.

ii) පහත ප්‍රකාශ ව්‍යාපාරයක ශක්තියක්ද දුර්වලතාවයක්ද යන්න දක්වන්න.

a) සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම.

b) අනවශ්‍ය සේවක පිරිසක් සිටීම

c) ඉහළ පොළියට ණය ගැනීම

d) අයිතිකරු දක්ෂ කළමනාකරුවෙකු වීම

iii) ව්‍යාපාරිකයා සහ ව්‍යවසායකයා අතර සමානකම් දෙකක් ලියන්න.

iv) ව්‍යවසායකයකු වර්ධනය කර ගත යුතු මූලික කුසලතා දෙකක් දක්වන්න.

v) කෙටියෙන් හඳුන්වන්න.

a) ශ්‍රමය b) ස්වභාවික පරිසරය (ල.2 x 5 = 10)

4) i) කුඩා පරිමාණ ව්‍යාපාරයක ලක්ෂණ දෙකක් නම් කරන්න.

ii) පහත සඳහන් ප්‍රකාශ කුඩා ව්‍යාපාර ආශ්‍රිතව දැකිය හැකි ශක්තියක් නම් ( ✓ ) ලකුණද නොවේ නම් (x) ලකුණ ද යොදන්න.

1) පුහුණු සේවක පිරිසක් සිටීම.

2) ව්‍යාපාර කටයුතු කුඩා ප්‍රදේශයකට සීමා වීම

3) රජයෙන් විශේෂ දිරි ගැන්වීම් ලැබීම

4) ආරම්භ කිරීමට විශාල ප්‍රාග්ධනයක් අවශ්‍ය වීම.

iii) ව්‍යවසායකයෙකු සතු සන්නිවේදන කුසලතාවයට නිදසුන් දෙකක් දෙන්න.

iv) ව්‍යාපාර තුළින් ව්‍යවසායකයන්ට හිමිවන ප්‍රතිලාභ අතරින් දෙකක් ඉදිරිපත් කරන්න.

v) ව්‍යාපාර වල පවත්නා ගති ලක්ෂණ දෙකක් දක්වන්න. (ල.2 x 5 = 10)

5) i) ව්‍යාපාර පරිසරය වර්ග කරන්න.

ii) A කොටසට ගැලපෙන අදහස B කොටසෙන් තෝරන්න.

| A | B |
|---|---|
| 1.ශුැමපෝනය | අ . දැනුම පදනම් කරගත් සංකල්පයකි. |
| 2.රොබෝ යන්ත්‍ර | ආ. දිගුවකි |
| 3.දුරකථනය | ඇ. අනපේක්ෂිත සිදුවීමකි |
| 4.විදුලි දුම්රිය | ඉ. නව සොයා ගැනීමකි |

iii) පරිමාණය අනුව ව්‍යාපාර වර්ග කරන්න.

iv) ව්‍යවසායකත්ව භූමිකා දෙකක් නම් කරන්න.

v) කුඩා ව්‍යාපාර තුළින් රටක ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ කවරේ ද? දෙකක් ඉදිරිපත් කරන්න.

(ල.2 x 5 = 10)

6) i) ව්‍යවසායකත්ව ප්‍රතිලාභ දෙආකාරයකි.නම් කරන්න.

ii) කුඩා ව්‍යාපාර ආශ්‍රිත සීමා දෙකක් දක්වන්න.

iii) ව්‍යවසායකයා සමාජ ශුභ සාධනයට දායක වන අවස්ථා දෙකකට නිදසුන් දෙන්න.

iv) ව්‍යාපාර අභ්‍යන්තර පරිසර සාධක කවරේද ?

v) අතීත සහ නූතන ව්‍යාපාර පරිසර අතර වෙනස්කම් දෙකක් දක්වන්න. (ල.2 x 5 = 10)

Remove Watermark Now
papers.lk
pdfelement